# 16. සැවොම පිළිගනිමු

**ජේසුස් වහන්සේ ජීවත් වූ සමාජයේ පිළිගැනීමට ලක් නොවූ බොහෝ අය වූහ. එවැනි සමාජයක් තුළ උන් වහන්සේ දේව රාජ්‍යයේ වටිනාකම් ඉස්මතු කර ක්‍රියා කළ ආකාරය විමසා බැලීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

**ශු. මාක් 10:13-16 , ජොහන් 4: 7-10, 25-30, 39**

ජේසුස් වහන්සේගේ වචනය ඇසීමට උන් වහන්සේ පසු පස පැමිණි බොහෝ ජනකාය අතර සිටි කාන්තාවෝ තම දරුවන් රැගෙන ආවේ ආශිර්වාද ලබා ගැනීම පිණිස ය.

මවක් :- අන්න අන්න ජේසුස් වහන්සේ මේ පැත්තට එනවා. අපි ඉක්මනින් අපේ දරුවන් රැගෙන යමු.

තවත් මවක් :- යමු යමු අපේ දරුවන් ආශිර්වාද කර ගන්න. උන්වහන්සේ ළඟට යමු.



ශ්‍රාවකයෙක් :- (තරවටු කරමින්) දැන් උන්වහන්සේට කරදර කරන්න එපා. මෙතන්න් අයින් වෙන්න.

මවක් :- අනේ අපේ දරුවන්ට ආශිර්වාද කර ගන්න යි අපි යන්නේ.

ශ්‍රාවකයෙක්:- අපි දැන් කිව්වනේ. ඔය ළමයි ගෙනල්ලා උන් වහන්සේට කරදර කරන්න එපා කියලා.

ජේසුස් වහන්සේ:- ළදරුවන් මා වෙත එන්න ඉඩ දෙන්න. ඔවුන් වළක්වන්න එපා. දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳු අය සන්තක ය.

මවක් :-අන්න උන් වහන්සේ දරුවන්ට කතා කරනවා. පුතාලා දූලා ඉක්මනින් උන් වහන්සේ ළඟට යන්න.

ජේසුස් වහන්සේ:-(දරුවන් තුරුලට ගෙන) සැබවින්ම මම ඔබට කියමී. යම් කෙනකු දෙවියන් වහන්සේගේ රාජ්‍යය ළදරුවකු සේ පිළි නොගත්තොත් ඔහු කිසිසේත් එහි ඇතුළු නොවන්නේ ය.

මෙලෙස ජේසුස් වහන්සේ දරුවන් උසස් පිළිගැනීමකට ලක් කළ සේක. දරුවන්ට ආදරය කරමින් ආශිර්වාද කළ සේක. "ස්වර්ග රාජ්‍යය මෙබඳුවන්ගේ "යයි පවසමින් දරුවන් අගය කරමින් දරුවන් හට මහත් වටිනාකමක් දුන් සේක. තවද දෙවියන් වහන්සේගේ රාජ්‍ය ළදරුවකු සේ පිළිගැනීම පිළිබඳව උන් වහන්සේ මෙහිදී සුවිශේෂිව ප්‍රකාශ කළ සේක. එනම් කුඩා දරුවන් සමාන වීම සහ දරුවන් සතු ගුණාංග වූ නිහතමානිකම, යටහත් පහත් බව මිනිස් ජීවිත පැවැත්ම තුළ තිබිය යුතු බව ය.

ඒ නිසා කිතුනු දරුවන් වන අප ද උන් වහන්සේගේ ආදරය හා ආශිර්වාදය හිමිකර ගැනීමට නිහතමානි හා යටහත් පහත් ගුණාංග අපගේ ජීවිතවලට එක්කර ගනිමු. එසේ කිරීමෙන් උන් වහන්සේගේ ආදරයට හා පිළිගැනීමට ලක් වන දරුවන් වෙමු.

**ජේසුස් වහන්සේට අපගේ ආදරය ප්‍රකාශ කරමින් ප්‍රීතියෙන් ගයමු.**

බාල කාලේ දී ම - මාගේ පුංචි සිත
දෙන ලෙස මම -එම් දැන් ඔබ වෙත
ජේසුනි එම් දැන් - එම් දැන් බැතින් ම
මා සිත සුද්ද කරන් - ඔබගේ ලෙයින් ම

එලෙසින් ම එදා සමාජයේ ජුදෙව් ජනතාව හා සමාරිත ජනතාව අතර කිසිදු සම්බන්ධකමක් නො තිබූ නමුත් ජේසුස් වහන්සේ සමාරිත ජනතාව පිළිගනිමින් ක්‍රියා කළ සේක. එවැනි අවස්ථාවක් පිළිබඳව සලකා බලමු.

පොතේ ගුරු - වඩියි සමාරිය මැදින් ජේසු තුම
ළිඳක් අසලකින් නවතියි වෙහෙසව
ස්ත්‍රියක් සමාරියේ ඇවිදින් එතැනට
සැරසෙයි දිය පුරවන්නට සැනෙකින

ජේසුස් සමිඳුන් ඇය අමතන්නේ
වතුර ටිකක් දෙන්නැයි කියමින්නේ
එනමුත් එම වදනට විගසින්නේ
අකමැති බව අඟවයි මෙලෙසින්නේ



සමාරියේ ස්ත්‍රිය :- ජුදෙව් සමාජය, සමාරියේ අප
පිළිගන්නැති බව දන්නා ඔබ තුම
වතුර ටිකක් මට දෙන්නැයි කියමින
අමතන්නේ ඔබ තුම මා කෙලෙසද

ජේසුස් වහන්සේ :- හඳුනයි නම් මා කවරෙකු දැයි ඔබ
ඉල්ලනු ඇත ඔහුගෙන් පැන් විගසින
දෙන්නෙමි ජීවන පැන් මම ඔබ හට
පිපාස නොවනට මින් මතු කිසි දින

පොතේ ගුරු - ජේසු සමිඳු ගැන හඳුනා ගත් ඇය
එතුමන් මෙසියස් තුම ලෙස පිළිගෙන
සමාරිය ගමේ සාක්ෂි දරමින
කැඳවයි ගම් වැසියන් එතුමන් වෙත

ජේසු සමිඳු සැම විටක ම සැම දෙන
පිළිගත් ලෙස කරුණා හදකින් සොඳ
කිතුනු අපි ද පවතිමු දෙව් ගුණ තුළ
සේවය කරමින සැම හට එක ලෙස

ඉහත ගීත නාටකයට අදාළ සිදුවීම තවදුරටත් කියවා බලමු.

**කියවා බලමු**

**ශු. ජොහාන් 4: 7-10, 25-30, 39**

සමාරියේ ස්ත්‍රිය හා ජේසුස් වහන්සේ අතර පැවති සංවාදය පිළිබඳ ඉගෙන ගැනීමේ දී ජුදෙව් හා සමාරියයන් අතර පැවති සමාජ පසුබිම හඳුනාගත හැකි ය. ජේසුස් වහන්සේ එම තත්ත්වය වෙනස් කරමින් සමාරියයන් ඉදිරියේ සේවය කිරීමට ඉදිරිපත් වූ සේක.

සමාරිය ස්ත්‍රිය ජේසුස් වහන්සේ, මෙසියස් වහන්සේ බව පිළිගෙන සාක්ෂි දැරූ ලෙස අප ද පළමුව ජේසුස් වහන්සේ හඳුනාගනිමු. අපගේ දුර්වලතා කුමක් වුවත් උන්වහන්සේ අපව ද සේවයට කැඳවන සේක. එම කැඳවීම හඳුනාගෙන ක්‍රියාශීලී ව කිතුනු සේවයක යෙදීම තුළින්

- සැවොම පිළිගැනීමට,
- සැමට ආදරය කිරීමට,
- සැම විට සැම හට සේවය කිරීමට යොමු වෙමු.



**අපි ජේසුස් වහන්සේට අපගේ යැදුම් ඔප්පු කරමු.**

ආදරණීය පියාණෙනි, අප සමාජයේද විවිධ හේතුන් නිසා පිළිගැනීමට ලක් නොවූ ආදරයට හා කරුණාවට ලක් නොවූ, අගය කිරීමට ලක් නොවූ බොහෝ අය සිටින බව දන්නා සේක. කිතුනු දරුවන් වන අපට ඔවුන් පිළිගෙන කටයුතු කිරීමටත් ආදරය දැක්වීමටත් අපගේ සිත් නැඹුරු කළ මැනව. දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගනිමින් ක්‍රියාශීලී ව සේවයේ නියැලීමට අපට ශක්තිය දුන මැනව ආමෙන්.

## ක්‍රියාකාරකම

1. ඔබේ පංතියේ නොපිළිගැනීමට ලක් වන අය වෙනුවෙන් ඔබට කළ හැකි ක්‍රියාවලියක් සඳහන් කරන්න.

2. ජේසුස් වහන්සේගේ ආදරය අත් දකින ඔබ ඒ පිළිබඳ තුති පුදමින් ගීතයක් හෝ කවියක් නිර්මාණය කරන්න.